# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 13,615 — 1963 අප්‍රේල් 26 වැනි සිකුරාද — 1963.4.26

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ආදිය .. .. | — | ආණ්ඩුවේ නිවේදන .. .. .. | 520 |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය .. .. | 517 | මිළ පාලන දැන්වීම් .. .. .. | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය .. | 518 | ශ්‍රී ලංකා මහා බැංකුවේ දැන්වීම් .. .. | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය .. | 518 | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා .. .. | — |
| වෙනත් පත්කිරීම් ආදිය .. .. .. | 520 | ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ .. .. | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය .. .. | — | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් .. .. .. | — |
| | | " සුරාබදු ආඥාපනත " පිළිබඳ දැන්වීම් .. .. | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය

### 1963 අංක 141

අංකය : ඞී.187/රෙක් ට/8.

**යුද්ධ හමුදා ආඥාපනත (357 වැනි අධිකාරය)**

අග්‍රාණ්ඩුකාර විලියම් ගොපල්ලව වන මම, 1963 අප්‍රේල් 26 වැනි දින සිට පහත සඳහන් ඒකකයන්, ලංකා කාලතුවක්කු රෙජිමේන්තුවේ ඒකකයන් වශයෙන් පැවැත්ම නතර විය යුතු යයි මෙයින් නිශ්චය කරමි :—

ලංකා කාලතුවක්කු හමුදාවේ 1 වෙනි ගගන යාත්‍රා නාශක මුහුදු බඩ තුවක්කු රෙජිමේන්තුව.

ලංකා කාලතුවක්කු හමුදාවේ 3 වෙනි කාරක රෙජිමේන්තුව.

ඩබ්ලිව්. ගොපල්ලව,
අග්‍රාණ්ඩුකාරවරයා.

1963 අප්‍රේල් 18 වැනි දින,
නුවරඑළියේ දීය.

4-780/1

### 1963 අංක 142

අංකය ඞී. 187/රෙක් ට/8.

**යුද්ධ හමුදාව—නිත්‍ය භට සේනාව**

**නිවේදනය**

1963 අප්‍රේල් 26 වැනි දින සිට ලංකා කාලතුවක්කු හමුදාවේ 4 වෙනි රෙජිමේන්තුව ලංකා කාලතුවක්කු රෙජිමේන්තුවේ ඒකකයක් විය යුතු යයි මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඇන්. කෲ. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1963 අප්‍රේල් 18 වැනි දින,
කොළඹ දීය.

4-780/2

## විශෙෂ නිවේදනයයි

1963 මැයි මස 7 වැනි සහ 8 වැනි දිනයන් ආණ්ඩුවේ නිවාඩු දිනයන් වන බැවින්, 1963 මැයි 10 වැනි දින නිකුත් කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1963 මැයි 3 වැනි සිකුරාද පස්වරු 3.30 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව කාගේත් දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1963 අප්‍රේල් 26 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

1963 අංක 143

අංකය : ඞී. 187/රෙක් ව්/8.

### යුද්ධ හමුදාව—නිත්‍ය භට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද පත් කිරීමක්

පත් කිරීම

1963 අප්‍රේල් 26 වැනි දින සිට ලංකා කාලතුවක්කු හමුදාවේ 4 වෙනි රෙජිමේන්තුවේ අණදෙන නිලධාරි වශයෙන් :—

ලුතිනන් කර්නල් ලෙනාඩ් මර්ලින් වික්‍රමසූරිය, ල.කා.හ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. කෲ. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

1963 අප්‍රේල් 18 වැනි දින,
කොළඹ දීය.

4-780/3

---

1963 අංක 144

අංකය : ඞී. 31/රෙක් ව්/1.

### යුද්ධ හමුදව—නිත්‍ය භට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම්

1962 මැයි මස 2 වැනි දින සිට පහත නම් සඳහන් නිලධාරීන් කපිතන් තනතුරට උසස් කරන ලදී:—

ලුතිනන් (තාවකාලික කපිතන්) ගොඩ්ප්‍රි එරික් ලෝසන් කොක්, ල.වි.යා.ඉ.

ලුතිනන් (තාවකාලික කපිතන්) ප්‍රාන්ගිගේ විමලදස්ස පෙරේරා, ල.වි.යා.ඉ.

ලුතිනන් (තාවකාලික කපිතන්) මානගේ හරිස්චන්ද්‍ර ගුණරත්න, ල.ස.ස.බ.

ලුතිනන් (තාවකාලික කපිතන්) චාර්ලස් ස්ටැන්ලි ප්‍රනාන්දු, ල.ස.ස.බ.

ලුතිනන් (තාවකාලික කපිතන්) ලාන්ස්ලොට් පීටර් ජෙරාඩ් ප්‍රනාන්දු, ල.ඉ.

ලුතිනන් (තාවකාලික කපිතන්) හැමිල්ටන් වනසිංහ, ල.ක.හ.

ලුතිනන් (තාවකාලික කපිතන්) ශ්‍රී මහා අශෝක ජයවර්ධන, ල.පා.හ. (නි)

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. කෲ. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

1963 අප්‍රේල් 17 වෙනිදා,
කොළඹ දීය.

4-786

---

1963 අංක 145

අංකය : ඞී/වීඑප්/10/ඒ.

### යුද්ධ හමුදව — ලංකා ස්වේච්ඡා බලසේනාව — අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද නිල සථිර කිරීමක්

1960 සැප්තැම්බර් මස 15 වැනි දින සිට මේජර් වශයෙන් :—

කපිතන් (තාවකාලික මේජර්) ලැන්ස්ලට් වික්ටර් රෙජිනෝල්ඩ් ප්‍රනාන්දු, ල.යු.වෛ.බ. (ස්වේ).

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. කෲ. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

1963 අප්‍රේල් 10 වෙනිදා,
කොළඹ දීය.

4-657

## රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය

1963 අංක 146

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පහත සඳහන් පත්කිරීම් කරන ලෙස නියමකර ඇත්තේය :—

ඒ. 41/47.

1963 අප්‍රියෙල් මස 13 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සිවිල් සේවක සී. ජේ. සේරසිංහ මහතා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් ලෙස වැඩ බැලීමට.

ඒ. 26/63.

1963 මාර්තු මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සිවිල් සේවක එන්. විජයවර්ධන මහතා මහනුවර පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ දිසාපති වශයෙන් වැඩ බැලීමට.

ඒ. 49/63.

1963 පෙබරවාරි මස 20 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සිවිල් සේවක එම්. එස්. පෙරේරා මහතා ආහාර කොමසාරිස්, ආහාර සැපයීමේ අධ්‍යක්ෂ, ආහාර පාලක සහ මිල පාලක (ආහාර) වශයෙන් වැඩ බැලීමට.

ඒ. 30/63.

1963 පෙබරවරි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සංවර්ධන අධ්‍යක්ෂ, සිවිල් සේවක ඞී. සී. එල්. අමරසිංහ මහතා, සවකීය රාජකාරිවලට අතිරේකව ලුණු කොමසාරිස් වශයෙන් වැඩ බැලීමට.

ඒ. 80/63.

1963 මාර්තු මස 13 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සිවිල් සේවක එම්. ජේ. පෙරේරා මහතා අධ්‍යාපන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් වශයෙන් වැඩ බැලීමට.

ඒ. 32/63.

1962 ඔක්තෝබර් මස 23 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සිවිල් සේවක ඒ. බී. සමරජීව මහතා ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ සහකාර පාලක වශයෙන් වැඩ බැලීමට.

ඒ. 133/62.

1962 දෙසැම්බර් මස 11 වැනි දින සිට වී. ටී. පණ්ඩිත ගුණවර්ධන මහතා අල්ලස් කොමසාරිස් තැන වශයෙන්.

සී. ජේ. සේරසිංහ,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1963 අප්‍රියෙල් මස 22 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කායර්‍යාලයේ දීය.
තැ. පෙ. 500.

4-777

---

## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරනු පත් කිරීම් ආදිය

1963 අංක 147

අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරණ ලද පත්කිරීම් පහත සඳහන් වේ :—

අංකය : ජේඑ්ඒ. 44/48.

එන්. එදිරිසිංහ මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1963 අප්‍රියෙල් මස 17 වැනි දින සිට මීගමුවේ දිස්ත්‍රික් උසාවියේ අංක 698/එම්, 274/එල් සහ 127/පී දරණ නඩුවල තීන්දු දීම පිණිස සහ මීගමුවේ දිස්ත්‍රික් උසාවියේ අංක 66/එල් දරණ නඩුව අසා අවසාන කිරීමට සහ තීන්දුව දීම පිණිස මීගමුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : ජේඑ්ඒ. 8/48(III).

එස්. තම්බි දුරෙයිසි මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1963 අප්‍රියෙල් මස 26 වැනි දින සිට මඩකලපුවේ දිස්ත්‍රික් උසාවියේ අංක 1996 මිශ්‍ර දරණ නඩුව අසා අවසාන කිරීමට සහ තීන්දුව දීමට මඩකලපුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට සහ මඩකලපුවේ අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට.

අංකය : ජේඒ. 3/48(II).

ජේ. ජී. එල්. ස්වාරිස් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1963 අප්‍රියෙල් මස 11 වැනි දින සිට අවිස්සාවේල්ල මහෙස්ත්‍රාත් උසාවියේ අංක 54144 දරණ නඩුවේ තීන්දුව දීම පිණිස සහ අවිස්සාවේල්ල මහෙස්ත්‍රාත් උසාවියේ අංක 57311 දරණ නඩුව අසා අවසාන කිරීම පිණිස සහ තීන්දුව දීම පිණිස අවිස්සාවේල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑම්. 2/56 (III).

ඩී. ඊ. ධර්මසේකර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එස්. ජේ. එම්. ජී. එස්. මුදන්නායක මහතා 1963 අප්‍රියෙල් මස 10 වැනි දින සිට 24 වැනි දින දක්වා බලපිටියේ මහෙස්ත්‍රාත් ධුරයට සහ රික්වෙස්ට් කොමසාරිස් ධුරයට සහ බලපිටියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඒ. 56/58(III).

එස්. ජේ. එම්. ජී. එස්. මුදන්නායක මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1963 මැයි මස 9 වැනි දින සිට ත්‍රිකුණාමලේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 1443 දරණ නඩුව අසා අවසාන කිරීම පිණිස සහ තීන්දුව දීමට ත්‍රිකුණාමලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ ත්‍රිකුණාමලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඒ. 22/48.

සී. එල්. ටී. මූනමලේ මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1963 මැයි මස 14 වැනි දින සිට හම්බන්තොට දිස්ත්‍රික් උසාවියේ අංක එල්. 28 දරණ නඩුව අසා අවසාන කිරීම පිණිස සහ තීන්දුව දීම පිණිස තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑම්. 2/56(III).

ඩී. එස්. නෙත්සිංහ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, සී. ඊ. මැන්දිස් මහතා 1963 අප්‍රියෙල් මස 10 වැනි දින සිට 30 වැනි දින දක්වා ගාල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට, ගාල්ලේ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට සහ ගාල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑම්. 2/56(III).

එම්. පී. සී. රත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, කේ. මාම්පිටිය මහතා 1963 අප්‍රියෙල් මස 12 වැනි දින සිට 24 වැනි දින දක්වා මීගමුවේ මහෙස්ත්‍රාත් ධුරයට සහ රික්වෙස්ට් කොමසාරිස් ධුරයට, මීගමුවේ නාගරික මහෙස්ත්‍රාත් ධුරයට සහ මීගමුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්/27.ඒ. 3/61.

එම්. හුසේන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ඩබ්ලිව්. ද සිල්වා මහතා 1963 අප්‍රියෙල් මස 10 වැනි දින සිට 13 වැනි දින දක්වා කළුතර අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට සහ කළුතර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 49.ඒ/53.

එම්. පී. සී. රත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ඒෆ්. ඩබ්ලිව්. ගුණරත්න මහතා 1963 අප්‍රියෙල් මස 11 වැනි දින මීගමුවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට, මීගමුවේ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට සහ මීගමුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 68.සී/51.

සී. වී. උදලාගම මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එච්. ඒ. ජයවික්‍රම මහතා 1963 අප්‍රියෙල් මස 11 වැනි දින සිට 17 වැනි දින දක්වා අනුරාධපුරේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, අනුරාධපුරේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට, මන්නාරමේ සහ වවුනියාවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, වවුනියාවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට, ත්‍රිකුණාමලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට සහ ත්‍රිකුණාමලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්/7.බී(56)(11).

එල්. එච්. ද අල්විස් මහතා වෙනත් රාජකාරිවල යෙදී සිටින අතර හෝ නැවත නියමයක් කරනතුරු, එන්. එලියතම්බි මහතා 1963 අප්‍රියෙල් මස 19 වැනි සහ 20 වැනි දිනයන්හි නුවරඑළියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, නුවරඑළියේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට, නුවරඑළියේ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට සහ බදුල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 3.ඒ/59.

ඒ. එම්. අමීන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, වී. එස්. ද සිල්වා මහතා 1963 අප්‍රියෙල් මස 18 වැනි දින සිට 20 වැනි දින දක්වා කුරුණෑගල, කතුදුල්ල උසාවියේ (කුලියාපිටියේ පළාත් ආණ්ඩු සභාව පිහිටි සීමාව තුළ) අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට සහ කුරුණෑගල, කතුදුල්ල උසාවියේ (කුලියාපිටියේ පළාත් ආණ්ඩු සභාව පිහිටි සීමාව තුල) අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 12.ඒ/57(1).

කේ. සී. ඊ. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එස්. එස්. ආරියරත්නම් මහතා 1963 අප්‍රියෙල් මස 12 වැනි දින සිට 16 වැනි දින දක්වා මඩකලපුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට සහ මඩකලපුවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්/40.ඒ/60.

සී. එල්. ටී. මූනමලේ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, පී. ජී. ද සිල්වා මහතා 1963 අප්‍රියෙල් මස 13 වැනි 14 වැනි, 15 වැනි සහ 16 වැනි දිනයන්හි අවිස්සාවේල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට සහ අවිස්සාවේල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑම්. 2/56(III).

කේ. මාම්පිටිය මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ඒෆ්. ඩබ්ලිව්. ගුණරත්න මහතා 1963 අප්‍රියෙල් මස 13 වැනි දින සිට 15 වැනි දින දක්වා මීගමුවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට, මීගමුවේ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට සහ මීගමුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්/3.බී/60.

එස්. අමරසිංහ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ඒ. සී. කනගසිංහම් මහතා 1963 අප්‍රියෙල් මස 17 වැනි දින සිට 20 වැනි දින දක්වා ත්‍රිකුණාමලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, ත්‍රිකුණාමලේ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට සහ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට, අනුරාධපුර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට සහ අනුරාධපුර අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්/48/48.

ඒ. එස්. පොන්නම්බලම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එස්. එම්. එම්. කාසිම් මහතා 1963 අප්‍රියෙල් මස 23 වැනි දින සිට 30 වැනි දින දක්වා හලාවත අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට, හලාවත අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, පුත්තලමේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට සහ පුත්තලමේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්/35.බී/61.

ඩී. ඩබ්ලිව්. කේ. ලද්දුවාහෙට්ටි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ජේ. එන්. සී. තිරුචෙල්වම් මහතා 1963 අප්‍රියෙල් මස 20 වැනි දින කොළඹ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට සහ කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඒ/14/48.

ජේ. එන්. සී. තිරුචෙල්වම් මහතා 1963 අප්‍රියෙල් මස 16 වැනි දින සිට කොළඹ ඒකාබද්ධ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 26574 සහ 26310 දරණ නඩුවල තීන්දු දීම සඳහා (කොළඹ කොටුවේ ක්‍රියා කරන පිණිස) කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ කොළඹ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඒ./38/48.

එල්. ඉලේතම්බි මහතා 1963 අප්‍රියෙල් මස 16 වැනි දින සිට මල්ලාකම් මහෙස්ත්‍රාත් උසාවියේ අංක 6133 දරණ නඩුවේ තීන්දුව දීම සඳහා මල්ලාකම්හි ක්‍රියා කරන පිණිස, යාපනේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ යාපනයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : පීඑල්/එච්.6/61.

පී. බී. හේරත් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, පී. ශ්‍රී පත්මනාදන් මහතා 1963 අප්‍රියෙල් මස 13 වැනි දින බදුල්ල දිස්ත්‍රික්කයේ උඩුකිඳ සහ වැල්ලවායේ ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඒ.29/57.

එන්. එස්. සිවප්‍රගාසම් මහතා 1963 අප්‍රියෙල් මස 1 වැනි දින සිට 6 වැනි දින දක්වා, 8 වැනි දින සිට 11 වැනි දින දක්වා, 13 වැනි, 15 වැනි, 16 වැනි, 18 වැනි, 19 වැනි, 22 වැනි දින සිට 27 වැනි දින දක්වා, 29 වැනි සහ 30 වැනි දිනයන්හි හෝ නැවත නියමයක් කරනතුරු, මඩකලපු දිස්ත්‍රික්කයේ කරවකු, නින්තාවූර්, සමන්තුරෙයි සහ වැගම් පත්තුවල ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එච්.1/48.

ව්. එල්. ජේ. හඩ්ජි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එම්. ඒ. ජී. බී. පෙරේරා මහතා 1963 අප්‍රියෙල් මස 27 වැනි, 29 වැනි සහ 30 වැනි දිනයන් හිද, 1963 මැයි මස 2 වැනි, 3 වැනි, 4 වැනි සහ 6 වැනි දිනයන් හිද, කුරුණෑගල වැලඹ්විලි හත් පත්තුවේ සහ හිරියාල හත් පත්තුවේ ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/යු. 1/48.

ජී. එම්. උදලාගම මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එම්. ඒ. එල්. අබේසේකර මහතා 1963 අප්‍රියෙල් මස 11 වැනි දින මහනුවර දිස්ත්‍රික්කයේ දකුණු මාතලේ සහ නැගෙන හිර මාතලේ ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එම්.7/56.

එන්. වී. ව්. මැන්දිස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ඒ. එෆ්. එච්. ද අල්විස් මහතා 1963 අප්‍රියෙල් මස 11 වැනි සහ 16 වැනි දිනයන්හි ගාලු සහ බලපිටිය දිස්ත්‍රික්ක වල ගඟබොඩ පත්තුවේ සහ හිනිදුම පත්තුවේ ගම්බද උසාවි සභාපති වශයෙන් හා වැල්ලබොඩ පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඒ. 5/53.

ඒ. බී. අළුවිහාරේ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, නිල් ද ජැකොලයින් මහතා 1963 අප්‍රියෙල් මස 11 වැනි සහ 13 වැනි දිනයන්හි අවිස්සාවේල්ල දිස්ත්‍රික්කයේ දෙහිගම්පල් කෝරලේ සහ පාත බුලත්ගම සහ අතුළුගම් සහ පනාවල් කෝරලයන්හි ගම්බද උසාවි සභාපති වශයෙන් හා බෙලිගල් සහ කුරුවිටි කෝරලයන්හි ගම්බද උසාවි අතිරේක සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඒ. 2/57.

එල්. පණ්ඩිතරත්න මහතා 1963 අප්‍රියෙල් මස 26 වැනි දින ගංගොඩවිල ගම්බද උසාවියේ අංක 306 දරණ සිවිල් නඩුව ඇසීම සඳහා, කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරලේ සහ සල්පිටි කෝරලේ සහ කොළඹ ආදායම් පාලක නිලධාරි තැනගේ කොට්ඨාශයේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන්.

ඇන්. ඒ. ද ඇස්. විජේසේකර,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1963 අප්‍රියෙල් මස 18 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංකය 573,
කොළඹ 12.

4-717

## වෙනත් පත් කිරීම් ආදිය

**1963 අංක 148**

### ගැසට් නිවේදනයයි

(20 වෙනි පරිච්ඡේදය) ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 120 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ ඇමතිතුමා විසින්—

අංකය : ඒ. අයි. 3/5/58.

1963, අප්‍රේල් මස 11 වැනි දින සිට, මහනුවර දිස්ත්‍රික්කයේ කඩවත් සහ ගඟවට කෝරලේ වැඩබලන හදිසි මරණ පරීක්ෂක වරයෙකු වශයෙන් එස්. එම්. සෙනෙවිරත්න මහතා ද,

අංකය : අයි. එන්. කයු/එල්. 21/3/63.

1963, පෙබරවාරි මස 7 වැනි දින සිට සී. වේලුපිල්ලේ මහතා නැවත වැඩ භාරගන්නාතුරු අම්පාරේ දිස්ත්‍රික්කයේ පනාමා පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට කේ. තල්ලෙසිනාදන් මහතා ද,

අංකය : අයි. එන්. කයු/එල්. 9/1/57.

1963, මාර්තු මස 23 වැනි දින සිට කේ. වයිතිලිංගම් මහතා නැවත වැඩ භාරගන්නාතුරු යාපනේ දිස්ත්‍රික්කයේ අනලායි තිව් කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට එන්. සෙල්වදුරෙයි මහතාද,

අංකය : අයි. එන්. කයු/එල්. 1/3/57.

1963 අප්‍රියෙල් මස 5 වැනි දින සිට එල්. පී. ජී. කරුණාරත්න මහතා නැවත වැඩ භාරගන්නාතුරු කොළඹ දිස්ත්‍රික්කයේ මීගමු නගර කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට ක්‍රිස්ටි ද කෘෘස් මහතා ද,

අංකය. අයි. එන්. කයු/එල්. 6/3/58.

1963, අප්‍රේල් මස 15 වැනි දින සිට ජේ. පී. ගුරුසිංහ මහතා නැවත වැඩ භාරගන්නාතුරු ගාලු දිස්ත්‍රික්කයේ බෙන්තර වල්ලාවිටි කෝරලේ වැසිහේන, හොරංගල්ල අම්බන යන විදාන ආරච්චි කොට්ඨාශවල හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට එච්. ඒ. ඩී. ධර්මරත්න මහතා ද,

අංකය. අයි. එන්. කයු/එල්. 21/3/62.

1963, අප්‍රේල් මස 10 වැනි දින සිට කේ. ඇම්. අබේසිංහ මහතා නැවත වැඩ භාරගන්නාතුරු අම්පාරේ දිස්ත්‍රික්කයේ වැව්ගම්පත්තු ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට කේ. සෝමසුන්දරම් මහතා ද,

අංකය : අයි. එන්. කයු/එල්. 9/1/63.

1963, අප්‍රේල් මස 1 වැනි දින සිට වී. කන්දසියා මහතා නැවත වැඩ භාරගන්නාතුරු යාපනේ දිස්ත්‍රික්කයේ කයිට්ස්-වෙලානෙයි ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට එම්. මුරුගේසු මහතා ද,

අංකය : අයි. එන්. කයු/එල්. 4/3/62.

1963, අප්‍රේල් මස 9 වෙනි දින සිට ඩී. කේ. පණ්ඩිතරත්න මහතා නැවත වැඩභාරගන්නාතුරු මාතලේ දිස්ත්‍රික්කයේ කොහොන්සිය පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට පී. විමලසිංහ මහතා ද,

පත් කර ඇත්තේ ය.

ඩී. ජේ. ආර්. ගුණවර්ධන,
අධිකරණ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1963, අප්‍රේල් මස 20 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදිය.

4-773

## ආණ්ඩුවේ නිවේදන

පීආර්/ඒ.එෆ්/III.

### ගැසට් නිවේදනය

කොළඹ සිටින ඩොමිනිකන් සමූහාණ්ඩුවේ නිර්වේතනික කොන්සල් ජනරාල්වර අබ්දුල් ඩබ්ලිව්. එම්. අමීර් මහතා දිවයිනෙන් බැහැරව සිටින කාලය තුළ, කොළඹ පිහිටි ඩොමිනිකන් සමූහාණ්ඩුවේ කොන්සල් ජනරාල් කායඝීලය, ජබීර්. ඒ. රෂීඩ් මහතාගේ බාරයේ තිබෙන බව මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් දැනුම් දෙමි.

ඇන්. කයු. දියෙස්,
ස්ථිර ලේකම් තුමා,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු භාර අමාත්‍යාංශය.

රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු භාර අමාත්‍යාංශය,
සෙනේට් මන්දිරය, කොළඹ 1,
1963 අප්‍රේල් මස 15 වෙනි දින.

4-664

අංකය : 965/15/150 (ඒඑස්බී/ඊපී).
දේ.ආ.කෝ.—ඕ.ආර්.ඩී. 87

ඇල්. ඩී.—ඩී. 130/46.

### දේශීය ආදායම් පනත

**67 (1) වැනි වගන්තිය යටතේ නිවේදනය**

1963 අංක 4 දරණ දේශීය ආදායම් පනතේ 67(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් ඇමති තැන් පත් ඉඩම්පිටිය රාල්ලාගේ ප්‍රංචි බණ්ඩා ගුණතිලක කලුගල්ල වන මම, මෙහි උපලේඛනයේ සඳහන් ආයතනය එකී වගන්තියේ කාර්යයක් සඳහා පිළිගත් පුණ්‍යායතනයක් හැටියට මෙයින් ප්‍රකාශයට පත් කරමි.

පී. බී. ජී. කලුගල්ල,
මුදල් ඇමති.

1963 අප්‍රේල් මස 18 වැනි දින,
කොළඹදී ය.

### උපලේඛනය

කෑගල්ලේ තරුණ බෞද්ධ සමිතිය

4-670 ඒ.

පී.එන්. 1752.

ඇල්. ඩී.—බී. 175 ඒ/29.

## පාසැල් ගුරු විශ්‍රාම වැටුප් පනත

(432 වෙනි අධිකාරය වන) පාසැල් ගුරු විශ්‍රාම වැටුප් පනතේ 9 වෙනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මුදල් ඇමති වරයා විසින් පනවනු ලැබූ නියෝගය.

පී. බී. ජී. කළුගල්ල,
මුදල් ඇමති.

1963 අප්‍රේල් මස 18 දින,
කොළඹ දී ය.

**නියෝගය**

1928 පෙබරවාරි මස 24 වෙනි දින හා අංක 7,631 දරණ ගැසට් පත්‍රයෙහි ("ව්‍යවස්ථා" යනුවෙන් එහි සඳහන්ව) ප්‍රසිඩ කරනු ලැබ, කලින් කල සංශෝධනය කරනු ලැබූ පාසැල් ගුරු විශ්‍රාම වැටුප් නියෝගවල (අංක 13,498 හා 1963 පෙබරවාරි මස 1 වෙනි දින දරණ ගැසට් පත්‍රයෙහි පළවූ නියෝගයෙන් ඇතුළත් කරනු ලැබූ) 9 ඇ නියෝගයේ (1) වෙනි ඡේදයෙහි "1963 මාර්තු මස තිස් එක් වෙනි දින" යන ඉලක්කම් හා වචන වෙනුවට "1963 මැයි මස තිස්එක් වෙනි දින" යන ඉලක්කම් හා වචන ආදේශ කිරීමෙන් තවදුරටත් ඒ නියෝග මෙයින් සංශෝධනය කරනු ලැබේ.

4-755

---

## සින්නපාඩු ධීවර ආරාවුල

කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල පිළිබඳ ගරු ඇමතිතුමා විසින් එවන ලද 1961 අගෝස්තු මස 31 වැනි දින දරණ ලිපියක් මගින් මෙම ආරාවුල විභාග කිරීම සඳහා මාවෙත පැවරිණි. එම ලිපියෙහි පාඨය මෙසේ යි :—

"ධීවර ආඥපනතේ (212 පරිච්ඡේදය) 20(1) වගන්තිය ප්‍රකාර, පුත්තලම් දිස්ත්‍රික්කයේ සින්නපාඩු සහ කන්දකෝඩුවාව යන ධීවර මධ්‍යස්ථානයන්හි පිහිටි 1 සිට 23 දක්වා නොම්මර යොදා ඇති පාඩුවල සිට මාදැල් එලන ධීවර කාර්මිකයින් සහ සින්නපාඩු හා කන්දකෝඩුවාව යන ධීවර මධ්‍යස්ථානවලට යාබද මුහුදේ තෙප්පන් වලින් මසුන් මරණ ධීවර කාර්මිකයින් අතර මෙම මුහුදු ප්‍රදේශයේ මසුන් ඇල්ලීමට ඔවුනොවුන් හට ඇති අයිතිවාසිකම් පිළිබඳව පැන නැගී ඇති ආරාවුලක් ගැන ප්‍රසිද්ධ විභාගයක් පැවැත්වීමට මම ඔබට පවරමි.

2. ආරාවුලට අඩංගු කරුණු මෙසේ යි :—

මාදැල් ධීවර කාර්මිකයෝ තමන්ගේ පාඩුවලට යාබද මුහුදු ප්‍රදේශයන් අනාදිමත් කාලයක සිට මාදැල් එලම සඳහාම පමණක් පාවිච්චි කරණු ලැබී යැයි කියාපාති. මෙම මුහුදු ප්‍රදේශයන්හි තෙප්පන් වලින් මසුන් ඇල්ලීම කරණකොට ගෙන තමන්ගේ මස් මැරීමේ කෙරෙහි අහිතකර බලපෑමක් ඇති වන්නේ යැයි චෝදනා කරමින් මාදැල් එලනු ලබන කාලසීමාව තුළදී මෙම මුහුදු ප්‍රදේශයන්හි තෙප්පන් වලින් මසුන් ඇල්ලීම සම්පූර්ණයෙන්ම තහනම් කරන ලෙස මොවුහු ඉල්ලා සිටිති.

තෙප්පන් ධීවර කාර්මිකයෝ තමන් මෙම මුහුදු ප්‍රදේශයන්හි මේ අන්දමේ මසුන් ඇල්ලීම දීර්ඝ කාලයක සිට කරගෙන ආ බව පවසමින් මෙම මුහුදු ප්‍රදේශයන්හි ඔවුන්ගේ මසුන් ඇල්ලීම් කෙරෙහි මාදැල් ධීවර කාර්මිකයින් විසින් බාධා පමුණුවනු ලබන බවද කියා සිටිති. අවහිර බාධක නොමැතිව ඔවුන්ගේ මසුන් ඇල්ලීම් කරගෙන යැමට අවසර දෙන මෙන් ඔවුහු ඉල්ලා සිටිති.

3. මෙම ආරාවුලට අඩංගු කරුණු පිළිබඳව පමණක් නොව මෙම වගන්තියේ විධි විධාන වලට අනුකූලව ඔබ වෙත ඉදිරිපත් කරන යම් සාක්ෂියක සඳහන් කරනු ලබන්නාවූ මෙම ආරාවුලට අදාලවූත් ඊට සම්බන්ධිත වූත් ඉන් පැන නගින්නාවූත් සියළුම කරුණු පිළිබඳවත් ප්‍රසිද්ධ විභාගයක් පවත්වා වාර්තා කරන ලෙස ඔබෙන් ඉල්ලා සිටිමි.

මෙයට,

ඔබේ යටහත් සේවක,

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග සහ විදුලිබල පිළිබඳ ඇමති.

මවිසින් පැවැත්වීමට නියමිතව තිබුණු ප්‍රසිද්ධ විභාගය පිළිබඳව ප්‍රචාරයක් ඇතිකරවීම පිණිස ධීවර ආඥපනතේ (212 වැනි පරිච්ඡේදය) 20 වැනි වගන්තියෙහි දක්වා ඇති විධිවිධාන අනුගමනය කර 1962 නොවැම්බර් 7, 8, 9 හා 21 යන දිනයන්හි බත්තුළුඔය සංචාරක බංගලාවේදී ප්‍රසිද්ධ විභාගය පැවැත්වීමි. ආරාවුල පිළිබඳව සැලකිල්ලක් දැක්වූ පක්ෂ වෙනුවෙන් ඉදිරිපත් කරන ලද සියලුම සාක්ෂිත්, එම පක්ෂ වෙනුවෙන් ඔවුන්ගේ නීතිඥයන් විසින් සැලකරන ලද කරුණුත් අවසන් කිරීමෙන් පසුව මගේ වාර්තාව පිළියෙළ කර සැලකිල්ලක් දක්වන පක්ෂ වෙත කියවීම සඳහා විභාගය 1962 දෙසැම්බර් 19 වැනි දිනට කල් තැබීමි. ඒ සඳහා එම දිනයෙහි පැමිණ සිටින ලෙස එම පක්ෂවලටද දැන්වීමි.

ධීවර අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කර තිබුණු ලිඛිත නියෝජන හතරක්—මාදැල් හිමිකරුවන් වෙනුවෙන් තුනක් හා තෙප්පම් හිමිකරුවන් වෙනුවෙන් එකක්—ධීවර අධ්‍යක්ෂ විසින් විභාගයට ප්‍රථම මා වෙත එවා තිබිණි ; මසුන් මරණ කාලය තුළදීත් ඉන් පිටතදීත් තෙප්පම් මගින් මසුන් මැරීම සම්පූර්ණයෙන්ම තහනම් කරන ලෙස මාදැල් කරුවෝ ඉල්ලා සිටියහ. මාදැල් ධීවරයන් වෙනුවෙන් නීතිඥ ඇස්. ඇම්. ඇම්. කාසිම් මහතාගේ උපදෙස් පිට අධිනීතිඥ කේ. සී. ද සිල්වා මහතා පෙනී සිටිය අතර නීතිඥ ඇස්. ඇම්. අබුතහීර් මහතා තෙප්පම් ධීවරයන් වෙනුවෙන් පෙනී සිටියේ ය.

සාක්ෂිදීම සඳහා කැඳවා තිබුණු සියළුම වැදගත් සාක්ෂිකරුවන් මෙන්ම ආරාවුල පිළිබඳව සැලකිල්ලක් දැක්වූ පුද්ගලයන්ද සැළකිය යුතු සංඛ්‍යාවක් පැමිණ සිටියහ.

සහකාර අධ්‍යක්ෂ වී. ඇල්. සී. පීටර්ස් මහතා සහ ධීවර දෙපාර්තමේන්තුවේ තවත් නිලධාරීනුත් පැමිණ සිටියහ.

### ආරාවුල

තුඩුදී ඇති ආරාවුලට සම්බන්ධිත ප්‍රදේශය පුත්තලම් දිස්ත්‍රික්කයේ සින්නපාඩුව වශයෙන් පොදුවේ හැඳින්වෙන අතර එම ප්‍රදේශයට සින්නපාඩු නමැති ගම හා කන්දකෝඩුවාව ඇතුළත්වේ. එම ප්‍රදේශය දකුණින් උඩප්පුවටද උතුරින් මුක්කුතෝඩුවාවටද සම්බන්ධිතව ඇත.

මේ වෙරළ ප්‍රදේශය "පාඩු" වලට බෙදා ඇත. එක පාඩුවක පළල යාර 450 ක් තරම් වේ. මෙම විභාගයට අදාල වෙරළ ප්‍රදේශය නොම්මර 1 පාඩුවේ (උඩප්පුව එක්කම උතුරින්) සිට නොම්මර 23 පාඩුව තෙක් විහිදී ඇති ප්‍රදේශයයි.

සෑම පාඩුවක් වෙනුවෙන්ම එම පාඩුවේ සිට මසුන් මරණ මාදැල් හිමිකරුවකුගේ නමින් බලපත්‍ර නිකුත්කර තිබේ. රජයට වෙන්කළ භූමියක් නිසා නොම්මර 11 පාඩුව වෙනුවෙන් බලපත්‍රයක් නිකුත් කර නොමැති නමුත් එය සඳහාද එක් අවුරුදු කාලයකට බලපත්‍රයක් නිකුත්කර තිබුණු අතර එම බලපත්‍රය නැවත අළුත්කර නොමැත.

මාදැල් වෙරළේ සිට අදිනු ලබන දැල් වර්ගයකි. මඩියක් වැනි මධ්‍යම දැලක දෙපැත්තෙන් අවශ්‍ය ප්‍රමාණය අනුව පැති දැල් ගැට ගසා දෙපැත්තේ අන්තිම පැති දැල් දෙකේ දැල අදින කඹ බැඳ මාදැල සාදාගනු ලැබේ. කඹ දෙකෙහි කෙළවරවල් වෙරළේ රඳවනු ලැබේ. මුළු දැලම විශාලතම ප්‍රමාණයකින් යුත් අතර දැල සම්පූර්ණයෙන්ම එලූ කල්හි වෙරළේ සිට සැතැපුම් දෙකක් තරම් ඈතට එය විහිදී තිබෙන බවට සාක්ෂි ඇත. වෙරළෙහි සිටින ධීවරයෝ දැලෙහි දෙකෙළවර කඹ වලින් දැල ගොඩට ඇද මසුන් ගොඩට ගනිත්. දැල් හා කඹ මුහුදට ගෙනයාම සඳහා පාරු හතරක් හෝ පහක්ද, දැල ඇදීම සඳහා ධීවරයන් 40 සිට 60 දක්වාවූ සම්පූර්ණ සංඛ්‍යාවක්ද මාදැලකට අවශ්‍යය. පාරු ඇතුළු සම්පූර්ණ මාදැල් කට්ටලයක වටිනාකම දළ වශයෙන් රු. 35,000ක් බව දක්වා ඇත

කොට තුනක් හෝ හතරක් එකට වෙළා සාදාගනු ලබන තෙප්පම් කුඩා, පැතැළි යාත්‍රාවකි. එහි සේවක පිරිස එක් අයෙක් නැත්නම් දෙදෙනෙකි. පාවෙන දැල් වශයෙන් හැඳින්වෙන දැල් නොයෙකුත් ප්‍රමාණයේ ඒවා තෙප්පම්වලින් ගෙන ගොස් මුහුදෙහි එළා ඒවායේ මසුන් පැටලුණු විට ගොඩට ඇදගනු ලැබේ. මෙහි වටිනාකම සැළකිය යුතු නැති තරම්ය. එය විශේෂයෙන්ම කුඩා පන්න කරුවකුගේ යාත්‍රාවක් වන අතර එය ක්‍රියාකරවනුයේ අයිතිකර විසින්මය.

සින්නපාඩු ප්‍රදේශයේ මාදැල් කරුවන් දැල් දමනුයේ මසුන් මැරීමේ කාලයේදී, එනම් ඔක්තෝබර් මාසයේ සිට ඊළඟ අවුරුද්දේ අප්‍රේල් මාසය දක්වාවූ ඊශාන දිග මෝසම් සමයෙහිදී පමණි ඔවුන්ගේ රැකියාවට අවශ්‍ය පරිදි මේ කාලය තුළ මෙහි මුහුද ශාන්තය. අප්‍රේල් සිට සැප්තැම්බර් දක්වාවූ වාරකන් කාලයේදී එනම් නිරිත දිග මෝසම් සමයෙහිදී ඔවුහු නැගෙනහිර වෙරළට සංක්‍රමණය වී එහි ශාන්ත මුහුදෙහි මසුන් අල්ලති. මෝසම් කාලය වෙනස්වූ විට නැවතත් බටහිර වෙරළ කරා පැමිණෙති. වාරකන් කාලයෙහිදී බටහිර වෙරළහි පාඩු වල ඇති තම ආම්පන්න රැකබලා ගැනීම පිණිස ඔවුහු මුරකරුවන් රඳවා යෙති.

මසුන් මරන කාලයේදී මාදැල් කරුවන් ඔවුන්ගේ දැල් දැමීමේ කටයුතු ආරම්භ කරනුයේ උදේ 7 ට පමණය. දැල් දැමීම, ගොඩ ඇදීම හා මසුන් ගොඩබෑම සඳහා එක දැලකට ගතවන කාලය පැය 2½කි. මසුන් රැන් තවත් සිටිනු පෙණෙත් නම් අවශ්‍ය අයුරින් පිට පිටම දැල දමනු ලැබේ. ඔවුහු රාත්‍රියේදී දැල් නොදමති.

අනිත් අතට තෙප්පම් ධීවරයෝ දිවා කාලයෙහි පන්න නොකරති. ඔවුන් පාන්දර 3 ට මුහුදු ගොස් උදේ 7 ට හෝ 8 ට පෙර වෙරළ කරා එන බව සාක්ෂිවලින් කියැවිණි.

1937 වර්ෂය තෙක් අවුරුදු ගණනාවකට සින්නපාඩු හා කන්ද-තෝඩුවාව ප්‍රදේශයේ තෙප්පම් පන්නය නොතිබුණු බවක් පෙනේ. එම වර්ෂයේදී තෙප්පම් සමහරක් ක්‍රියාවේ යෙදවිණි. නමුත් ඒවා තහනම් කරන ලදී. එදා සිට 1953 වනතුරු තෙප්පම් පන්න නොකෙරිණි.

1953 අවුරුද්දේදී, ප්‍රනාන්දු නමැති මාමකුට හා බෑනකුට අයිති තෙප්පම් දෙකක් මෙම ප්‍රදේශයෙහි ක්‍රියා කරවිණි. මේ ධීවරයන් දෙදෙන ඔවුන්ගේ තෙප්පම් ක්‍රියාකරවූයේ වාරකන් කාලයේදී පමණි. මෙම තෙප්පම් දෙක 1959 වනතුරු ලියා පදිංචිකර වාරකන් කාලයෙහි පමණක් පන්නකරමින් තිබිණි.

1956 අවුරුද්දේදී එම වර්ෂයේ ජූනි මාසයේ සිට නොම්මර 10 පාඩුවෙන් තෙප්පම් පන්නය කිරීමට කොට්ටන්තිවු ග්‍රාම සංවර්ධන සමිතියට බලපත්‍රයක් නිකුත් කරණ ලදී. සීමා සහිත දූව ධීවර කාර්මිකයන්ගේ සමූපකාර වෙළඳ සමිතිය විසින් එයට විරෝධය පළකරන ලදුව පුත්තලමේ දිසාපති විසින් එම බලපත්‍රය 1956 සැප්තැම්බර් 30 වැනි දින සිට ඉල්ලා අස්කරගන්නා ලදී. මෙම දිනය 56.9.30 බටහිර වෙරළේ මාදැල් දමන කාලය හා සම්බන්ධ වන බැව් මට පෙනේ.

1958 අවුරුද්දේදී මෙම ප්‍රශ්නය පිළිබඳව නැවතත් සාකච්ඡා කරන ලදුව පුත්තලමේ දිසාපති විසින් 1958 අගෝස්තු 29 වැනි දින මෙසේ සටහන් කරන ලදී :—" මෙම ප්‍රදේශයෙහි තෙප්පම් පන්නයට අවසර දීමේ ප්‍රශ්නයක් උද්ගත නොවේ."

1960 දී තවත් තෙප්පම් 4 ක් සඳහා බලපත්‍ර ලබාගැනීමෙන් තෙප්පම් සංඛ්‍යාව 6 ක් වූයේය. අළුත් තෙප්පම් 4 න් එකක් 1953 සිට තෙප්පම් පන්නය කළ " මාමා සහ බෑනා " ගෙන් මාමා වන ඩබ්ලිව්. අන්තෝනි ප්‍රනාන්දු විසින් ලියා පදිංචි කරගත් අතර, එකක් ඩබ්ලිව්. ජෝෂප් ප්‍රනාන්දු විසින්ද, එකක් ඩබ්ලිව්. ජේ. ප්‍රැන්සිස් ප්‍රනාන්දු විසින්ද, අන්තිම එක ඇන්. ජී. ස්ටීවන් ලිවේරා විසින්ද ලියා පදිංචි කරවා ගත්හ. මෙම තෙප්පම් හය 1960 ක්‍රියාවේ යොදවන ලද්දේ වාරකන් කාලයේදී පමණක් බැව් එවකට සින්නපාඩුවේ උප ධීවර පරීක්ෂකව සිටි පාතා මහතා ප්‍රකාශ කරයි.

1961 දී තවත් තෙප්පම් 6 ක් ලියා පදිංචි කිරීමෙන් තෙප්පම් සංඛ්‍යාව 12 ක් වූ අතර, මසුන් මැරීමේ කාලය තුළදී තෙප්පම් පන්න කිරීම පළමුවරට ආරම්භ කරන ලදී.

මාදැල් කරුවන් දැඩි ලෙස එයට විරුද්ධකම් දැක්වූ අතර කෝලාහල ද ඇතිවිණි.

1961 දෙසැම්බර් මාසයේදී තෙප්පම් ධීවරයන්ගේ සාමාජිකත්ව යෙන් යුතුව සීමා සහිත ලූර්දු මාතා සමූපකාර ධීවර හා වෙළඳ සමිතිය නමැති සමූපකාර සමිතියක් පිහිටුවන ලදී. මෙම සමිතිය මේ ආරාවුලට සහභාගී එක් පක්ෂයක් වන අතර එය තෙප්පම් ධීවරයන් වෙනුවෙන් පෙනී සිටින්නීය.

මෙම ආරාවුලට සම්බන්ධ ප්‍රදේශය අවුරුදු බොහෝ ගණනක් මුළුල්ලේ සම්පූර්ණයෙන්ම මාදැල් පන්නයට පමණක් සීමාවී තිබුණු බව සාක්ෂිවලින් පැහැදිලිය. 1953 සිට 1959 දක්වා මෙහි තෙප්පම් පන්නය කළේ තෙප්පම් ධීවරයන් දෙදෙනකු පමණි. එයද වාරකන් කාලයේදී පමණය. 1960 දී ද තෙප්පම් 6 ක් වාර කන් කාලයේදී පමණක් ක්‍රියා කරවන ලදහ. තෙප්පම් ධීවරයන් තෙප්පම් පන්නය මසුන් මරණ කාලයේදී කිරීමට ආරම්භ කරණ ලද්දේ 1961 දී ය.

ලංකාවේ මුළු මත්ස්‍ය නිෂ්පාදනයෙන් තුනෙන් දෙකොටසක් මාදැල්වලින් ලැබෙන බව මාදැල් ධීවරයන් වෙනුවෙන් ප්‍රකාශකර ඇත. මෙය සමහර විට අතිශයෝක්ත ප්‍රකාශයක් විය හැකිය. ධීවර පයේෂණායතනයේ ප්‍රවෘත්ති සංග්‍රහය අංක 4, 1952 සිට 1954 දක්වාවූ අවුරුදු තුනේ සාමාන්‍ය ගණන පදනම් කරගෙන මේ සංඛ්‍යාව 38.6% බව දක්වා මාදැල් ලංකාවේ මාළු සපයාදීමේ ඉතා මත් වැදගත් තනි මාර්ගයක් බවත් අපේ ජාතික උන්නතිය කෙරෙහි සැළකිල්ලක් දක්වන සියල්ලන්ගේම අවධානයට ලක්විය යුතු බවත් ප්‍රකාශකර, ඉතාමත් සැළකිල්ලකින් යුතුව කලින් කල්පනා කර නොබලා එයට ඇඟිලි ගැසීම අවැඩදායක බව දක්වයි. එසේ වුවත්, මාදැල මසුන් මැරීමේ අකාර්යක්ෂම උපක්‍රමයක් ලෙසද එහි හඳුන්වා, ධීවරයන් මාදැල් අත්හැර දමා තෙප්පම් මඟින් ගොස් අත් යොත් පන්නය හෝ කරමල් දැල් පන්නය හෝ පටන්ගත හොත් ලංකාවේ ආහාර ප්‍රමාණයට ඔවුන්ගෙන් සැපයෙන ප්‍රමාණය දෙගුණයකටත් වඩා වැඩිවනු ඇතැයිද දක්වා තිබේ.

පොදු නීතිය යටතේ ඕනෑම අයකුට, කැමැති ස්ථානයක, කැමැති වේලාවක, කැමැති අන්දමකට මසුන් මැරීමට හිමිකම් තිබේ. එය ඉතාමත් පැහැදිලිය.

එමෙන්ම, ධීවර ආඥාපනත (212 පරිච්ඡේදය) යටතේ ධීවර කර්මාන්තය භාර ඇමැතිතුමාට එවැනි අයිතිවාසිකම් සීමා කිරීමේ හෝ අවලංගු කිරීමේ හෝ බලයක් තිබෙන බවද පැහැදිලිය.

මෙම විභාගයේදී විසඳීමට ඇති කරුණ වූකලි මේ ප්‍රදේශයේ අසල මුහුදෙහි තෙප්පම් පන්නය කිරීමට තෙප්පම් කරුවන්ට ඇති අයිතිවාසිකම සීමා කිරීමට හෝ අවලංගු කිරීමට හෝ ඇමතිතුමා විසින් ස්වකීය බලය මේ අවස්ථාවේදී යෙදිය යුතුදැයි යන්නයි.

මේ ප්‍රශ්නය පළමුවෙන්, වාරකන් කාලයේදී පන්න කිරීම හා දෙවැනිව, මසුන් මරණ කාලයේදී එනම්, ඔක්තෝබර් සිට මාර්තු දක්වා කාලයේදී පන්න කිරීම යනුවෙන් කොටස් දෙකකට බෙදා සළකා බැලීම පහසුවනු ඇත.

**වාරකන් කාලයේදී පන්න කිරීම**

බිත්තර දැමීම සඳහා වෙරළ කරා පැමිණෙන මසුන් තෙප්පම් පන්නය නිසා කැළඹෙතියි යන මතය උඩ තෙප්පම් පන්නයට විරෝධය පළ කරති. ආහාර සුලබව ලැබෙන මඩ සහිත දිය පතුළට මසුන් ඇල්මක් දක්වති. තෙප්පම් වලින් දමනු ලබන පාවෙන දැල් වලට බැඳ ඇති බරු දිය පතුලේ ඇදී මසුන් කළඹවා, බියවද්දා පළවා හැර බිත්තර දැමීම කඩා කප්පල් කරයි. මේ හේතුවෙන් මස් මරණ කාලය තුළදී පන්න කිරීම කෙරෙහි අහිතකර බලපෑම් ඇතිවේ.

බටහිර වෙරළේ මසුන්ගේ බිත්තර දැමීමේ සිරිත් පිළිබඳව පිළි ගත හැකි කිසියම් ප්‍රකාශයක් සොයා ගැනීමට මට නොහැකිවූ නමුත් මසුන් බිත්තර දැමීම සඳහා නිරිත දිග මෝසම් සමයේදී එළි මහත් වෙරළ බඩ කලබල කාරී ජල ප්‍රදේශයක් තෝරාගනු ඇතැයි සිතීමට කිසිසේත් නොහැකිය. පාවෙන දැල්වල ඇති බරු නිසා මසුන් බියවැදී පලායතියි යන කියමන සම්බන්ධයෙන් ධීවර අධ්‍යක්ෂ විසින් 1957 ජූනි මාසේ 26 වැනි දින කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් වෙත යැවුණු ලිපියක එම නිගමනය සම්පූර්ණයෙන්ම වැරදි බව දක්වා තිබේ.

මෙම ප්‍රදේශයේ මාදැල් පන්නය කරනුයේ වැඩි වශයෙන්ම සංක්‍රමණය ධීවරයන් විසිනි.

මෙහි සාක්ෂි දුන් එක් මාදැල් අයිතිකරුවෙක් මාදැලක වැඩ කිරීමට පුද්ගලයන් 60 දෙනකුගේ සිට 65 දෙනකු දක්වා සංඛ්‍යා වක් අවශ්‍ය බව පැවසීය. ඔහු යටතේ වැඩකළ සියළුම අය ඔහුගේ ප්‍රදේශයෙන් මීගමු දිස්ත්‍රික්කයෙන් පැමිණි අයය. මෙහි පදිංචිකරු වන්ගෙන් ඔහුගේ දැල්වල වැඩ කරනුයේ තිදෙනකු පමණි. මේ තුන්දෙනා ගෙන් එක් අයකු වාරකන් කාලයේදී දැල් පන්න රැක බලා ගැනීමට යොදවා ඇති අතර අනිකුත් දෙදෙනා ගොවියන් ලෙස රක්ෂාව කරත්. තවද, නොම්මර 1 සිට 23 දක්වා වූ පාඩු අසබඩ වෙරළ ප්‍රදේශයේ ජීවත්වන අය දූව සහ පිටිපන (මීගමු දිස්ත්‍රික්ක යේ) ප්‍රදේශවලින් මෙහි පැමිණ පදිංචිවූ අයගෙන් පැවතෙන්නන් බවත් ඔහු පැවසීය. එමනිසා, මෙහි පදිංචිව සිටින අය දිග ධීවර පරම්පරාවකින් පැවත එන, මුහුදු දිය සිරුරට කාවැදී ඇති අයබව පැහැදිළිය.

පාඩු 1-23 ට මා ගොස් තෙප්පම් ධීවරයන් කිහිප දෙනකුටද කථාකර පැය කිහිපයක් එහි ගත කළා. තෙප්පම් ධීවරයන් වෙනු වෙන් කථා කළ තැනත්තාගේ විලාශය මා සිත් ගත්තා. තමන්ගේ දියුණුවූ ආර්ථික තත්ත්වය ගැන ඔහු කථා කළේ පැහැදිලි තෘප්ති මත් භාවයකිනි. මේ අයට ආධාර ලැබිය යුතු බව පැහැදිළි අතර ඔවුන්ට ආධාර දිය යුතු වන්නේය. මේ අයවලුන් විසින් වාරකන් කාලයේදී තෙප්පම් පන්නය කිරීම නිසා ඒ කාලයේදී පන්න නොකරන මාදැල් ධීවරයන්ට කුමන අයුරකින් හෝ අහිතකර හානි සිදුවේයැයි මට නොපෙනේ.

**මසුන් මරන කාලයේදී පන්න කිරීම**

අවුරුදු 25කට ඉහතදී හලාවත මාදැල් පන්නය කෙරුණු බව සාක්ෂිවලින් පැහැදිළිවේ. එහෙත් තෙප්පම් කරුවන් විසින් මාදැල් පන්නය කඩාකප්පල් කිරීම නිසා මාදැල් කරුවන්ට හලාවත අත් හැර යාමට සිදුවිය. සින්නපාඩුව අසල මුහුදේ පතුළ ක්‍රම ක්‍රමයෙන් බහින නිසාත්, දැල් පැටලී කැඩී යාහැකි ගල්පර දිය පතුළෙහි නොමැති නිසාත් එම ප්‍රදේශය මාදැල් පන්නයට ඉතාමත් හිතකරය. එම නිසා මේ ප්‍රදේශයේ තෙප්පම් කරුවන්ගෙන් ආරක්ෂා කර ගත යුතු බව ප්‍රකාශ කෙරිණි.

සින්නපාඩුවට දකුණින් පිහිටි උඩප්පුවෙන්, සින්නපාඩුවට උතු රින් පිහිටි ප්‍රදේශවලත් මාදැල් හා තෙප්පම් උරෙනුර ගැටී ක්‍රියා කරවනු ලැබෙත්.

එම ප්‍රදේශවල එසේ කිරීමට හැකිවනුයේ, සින්නපාඩුවේ මෙන් නොව, එහි ඇතැම් ස්ථානවල ගල්පර ඇති හෙයින් එවැනි ස්ථාන මාදැල් පන්නයට අයෝග්‍ය නමුත් තෙප්පම් පන්නය කිරීමට යෝග්‍යවන නිසායැයි පැහැදිලි කරන ලදී.

ඉදිරිපත් කරන ලද අද්මිරාල්තිය සිතියම පරීක්ෂා කිරීමේදී මේ වෙරළ ප්‍රදේශ සම්බන්ධයෙන් දක්වන ලද ඒම භෞතික ලක්ෂණ සත්‍යබව වැටහිණි. එහෙත් හලාවත වෙරළ සමීපයේද සැළකිය යුතු තරම් ගල්පර ඇති බැව් එම සිතියමෙහි පෙන්නුම් කෙරේ. එහෙයින් හලාවත මාදැල් පන්නය අහෝසි වීමට මේ ගල් පරත් එක හේතු වක් වන්නට ඇත.

සින්නපාඩු ප්‍රදේශයේ සමහර පාඩුවලින් 1960-61 හා 1961-62 මසුන් මරණ කාලවලදී අල්ලාගන්නා ලද මසුන් තොග පිළිබඳව ජෙරමියස් ප්‍රනාන්දු මුදලි යටතේ සේවය කරන ඇස්. එච්. ඩේවිඩ් සිල්වා නමැති ගිණුම් ලිපිකරු සාක්ෂි දුන්නයේ. පී. 19 හා පී. 19 ඒ වශයෙන් ලකුණු කරන ලද ප්‍රකාශයක් ඔහු විසින් ඉදිරිපත් කළේය. එම ප්‍රකාශය පිළියෙල කර ගැනීමට ඉවහල් වූ පොත් පත් මම පරීක්ෂා කර බැලුවෙමි. එම පොත් මනා අන්දමින් තබා ඇති බව මම පිළි ගනිමි. එම ප්‍රකාශය ප්‍රකාර මෙම පාඩුවලින් 1960-61 දී අල්ලා ගන්නා ලද මසුන් රාත්තල් 4,51,200 1961-62 දී රාත්තල් 3,98,418 දක්වා අඩුදී ඇති බැව් පෙනේ. මෙසේ වීමට හේතුව එම අවුරුද්දේදී තෙප්පම් ක්‍රියාකරවීම නිසායයි දක්වන ලදී. එම අඩුවීම රාත්තල් 53,000ක් තරම්ය. එය සියයට 12 ප්‍රමාණයකි. කලින් සඳහන් කරන ලද ප්‍රවෘත්ති සංග්‍රහය අංක 4 ඕනෑම ධීවර කර්මාන්තයක ගොඩබෑම් 20%කින් වෙනස්වීම සවාභාවික දෙයක් බව දක්වයි.

ධීවර අධ්‍යක්ෂගේ 1959 සඳහා වූ පාලන වාර්තාවෙහි L 80 වැනි පිටුවේ ඇති II වැනි චක්‍රයෙන් සින්නපාඩුවේ (වාර්තාවෙහි මුන්දලම ලෙස දක්වා ඇත) අළුත් මාළු නිෂ්පාදනය හොණ්ඩර 86,335ක් බව දැක්වෙන අතර, L 82 වැනි පිටුවේ IV වැනි චක්‍රයෙන්, එම ප්‍රදේශයෙහි සකස් කරන ලද මසුන් නිෂ්පාදනයේ වියළි බර හොණ්ඩර 29,514ක් බව දැක්වේ. III වැනි හා V වැනි චක්‍රවල දක්වා ඇති වාරකන් කාලයේදී අල්ලාගත් මසුන් ප්‍රමාණයට සැසැඳීම පිණිස මේ සංඛ්‍යා පිළිවෙලින් හොණ්ඩර 70,983 හා 25,788 යනුවෙන් වෙනස් කළ යුතු යැයි මට හැඟේ. ඒ කෙසේ වෙතත් සින්පාඩුව අළුත් මාළු නිෂ්පාදනය අතින් දෙවැනි වනුයේ යාපනයට පමණක් බවත්, සකස් කළ මාළු නිෂ්පාදනය අතින් නම් සින්නපාඩුව ලංකාවේ විශාලතම නිෂ්පාදකයා බවත් මේ සංඛ්‍යාවලින් හෙළිවේ. මේ මසුන් තොග වලින් වැඩි කොටසක් සැපයෙනුයේ මාදැල් පන්නයෙන් බව කිවයුතු නොවේ.

තෙප්පම් පන්නය හා මාදැල් පන්නය එකවිටම කිරීමට ඉඩ හැරීම ප්‍රඥගොචර නොවේ යයි සිතත් නම්, රාත්‍රියේදී මුහුදු යන තෙප්පම් සියල්ලම යටත් පිරිසෙයින් උදේ 7ට එනම්, මාදැල් පන්නය ආරම්භ කිරීමට, පළමු ආපසු වෙරළ කරා පැමිණෙන් නම් තෙප්පම් පන්නය කෙරෙහි විරෝධයක් පළ නොකළ යුතුයැයි කියා සිටින ලදී. තෙප්පම් දැල් රාත්‍රියෙහි මුහුදෙහි දැමූ කල මුහුදෙහි කබ්බ ඇතිවී මාළු රැන් බියවැදී පළායන නිසාත්, එමෙන්ම, අළුයම් කාලයේ නොගැඹුරු සිහිල් දියෙහි ආහාර සොයා වෙරළ කරා එන මාළු රැන්වලට තෙප්පම්වලින් දමා ඇති පාවෙන දැල් පේළියක් පසුකර ඒමට සිදුවන නිසාත්, ඉන් මසුන් බියවැදී පලා නොගියත් ඔවුන් වෙන අතකට හැරී යා හැකිවන නිසාත්, ඉහත දැක්වූ අදහස ප්‍රශ්නය විසඳීමේ මඟක් නොවන බව විරුද්ධ පක්ෂයෙන් කියා සිටියහ.

මුහුදු දියෙහි කබ්බ ඇතිවීම සවභාවික සිද්ධියක් නිසාත්, ඇතැම් අවසථාවලදී මාළු රැන් දියෙහි ගැටීමෙන් ඒ කබ්බ වැඩිවන නිසාත් ඉහත සඳහන් ප්‍රකාශය සම්පූර්ණයෙන්ම පිළිගැනීමට මට නොහැකිය. එසේ වුවත්, එයද එක් හේතුවක් විය නොහැකි බව අවිනිශ්චිත අතර, පාවෙන දැල් පේළියකින් මසුන් හරවා වෙන දෙසකට නොයැවුනත්, මාදැල් පන්නයට අහිතකර වන ලෙස වෙරළ කරා එන මාළු රැන් යටත් පිරිසෙයින් ප්‍රමාද කරවිය හෝ හැකි බව මට වැටහේ.

තෙප්පම් ධීවරයන්ගේ අභිලාශයන් ගැන අනුකම්පා කරන අතරම, ඔවුන්ට හැකි හැම ආධාරයක්ම දිය යුතුයයි හොඳින්ම පිළිගන්නා අතර, සින්නපාඩුවේ මාදැල් පන්නය ලංකාවේ වර්තමාන ආර්ථික තත්ත්වයට බෙහෙවින් වැදගත් වන නිසා, දැනට ඉතා හොඳින් සම්පූර්ණව හා සංවිධානය වී ඇති මේ කර්මාන්තය වෙනුවෙන් යෙදිය හැකි සනාථ කරුණු අනිකුත් පන්නයක් නැති නිසා එයට අහිතකර බලපෑම් ඇතිවිය හැකි කිසිදෙයකට ඉඩ නොහැරිය යුතු බවට තීරණය කිරීමට විනා අන් කළ හැකි දෙයක් මට නොමැත. මසුන් මරණ කාලය තුළදී එම වෙරළ ප්‍රදේශය ඔබ්බෙහි තෙප්පම් පන්නයත් කිරීමෙන් එවැනි අහිතකර හානි සිදු නොවන බව අවිනිශ්චිතය. කුමක් හෝ වේවා තෙප්පම් පන්නය පළමුවරට මසුන් මරන කාලයේදී කරන ලද්දේ 1961 වර්ෂයේදීය.

එමනිසා මම මෙසේ නිර්දේශ කරමි :—

(1) සින්නපාඩුව හා කන්දතෝඩුවාව ප්‍රදේශවල නිර්ව්‍යාජ පදිංචි කරුවන්ට, ඒ ඒ අවුරුද්දේ අප්‍රේල් සිට සැප්තැම්බර් දක්වා කාලය තුළදී යාබද ජලාශවල මසුන් මැරීම සඳහා තෙප්පම් භාවිතා කිරීමට අවසර දිය යුතුය.

(2) එක් එක් අවුරුද්දේ ඔක්තෝබර් මාසයේ සිට ඊළඟ අවුරුද්දේ මාර්තු මාසය දක්වා කලාය තුළ මේ ජලාශයන්හි කිසිම තෙප්පමක් භාවිතා කිරීමට අවසර නොදිය යුතුය.

(3) ඉහත (1) හා (2) ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යවසථා පැනවිය යුතුය.

(4) මෙම ගැටළුව පිළිබඳව ශාස්ත්‍රානුකූල සමීක්ෂණයක් පැවැත්වීමට තරම් වන සෑහෙන කාර්මික කරුණු රැස්කර ගැනීමට ධීවර අධ්‍යක්ෂට හැකිවූ විටක මේ ප්‍රශ්නය සහමුලින්ම ප්‍රතිශෝධනය කළ යුතුය.

මෙම විභාගය පැවැති කාලය මුළුල්ලේම මට දුන් සහාය පිළිබඳව මෙම ආරාවුලට සහභාගී පක්ෂයන් වෙනුවෙන් පෙනී සිටි අධිනීතිඥ කේ. සී. ද සිල්වා මහතාට හා නීතිඥ ඇස්. ඇම්. අබුතාහීර් මහතාටත්, විභාගය පැවැත්වීම සඳහා විශිෂ්ඨ ලෙස කටයුතු පිළියෙල කර තිබුණු සහකාර ධීවර අධ්‍යක්ෂ වී. ඇල්. සී. පීටර්ස් මහතාට හා ඔහුගේ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ටත්, ඉතාමත් කාර්යක්ෂම අයුරින් ක්‍රියාකරමින් මට විශාලතම සහායක් දුන් තෝල්කයින්ට හා ලඝු ලේඛකයාටත් ම විසින් කෘතඥතාවය පළ කළ යුතුය.

සිරිල් වැන්ලැන්ගන් බර්ග්,
කොමසාරිස්.

1962.12.19.

පෙ. ව. 10.15

මෙය මවිසින් කියවන ලදී. ආරාවුලට සහභාගී පක්ෂයන්ගේ අනුමැතිය ලබ සාරාංශය සිංහලට හා දෙමළට පරිවර්තනය කර කියවන ලදී.

සිරිල් වැන්ලැන්ගන් බර්ග්,
කොමසාරිස්.

1962 දෙසැම්බර් මස 19 වැනි දින.

4-729/2

---

## ධීවර ආඥාපනතේ (212 වැනි පරිච්ඡේදය) 20 (9) වගන්තිය යටතේ කරන ලද නිවේදනයයි

පුත්තලම් දිස්ත්‍රික්කයේ සින්නපාඩු හා කන්දතෝඩුවාව යන ධීවර මධ්‍යස්ථානයෙහි මාදැල් එලන ධීවර කාර්මිකයින් සහ ඒ අවට යාබද මුහුදේ තෙප්පන් වලින් මසුන් මරන ධීවර කාර්මික යින් අතර මෙම මුහුදු ප්‍රදේශයේ මසුන් ඇල්ලීමට ඔවුනොවුන් හට ඇති අයිතිවාසිකම් පිළිබඳව පැන නැගී ඇති ආරාවුල පිළිබඳ වග විභාගකර බැලීමට පත් කරන ලද සමථයට පමුණුවන නිලධාරි තැනගේ වාර්තාව මහජනයාගේ දැන ගැනීම පිණිස පහත පළ වේ.

මෙම ධීවර අරගලයෙන් හිරිහැරයට පත් කෙනෙක් හෝ මීට සම්බන්ධවන යමකින් හෝ ඊට හේතුවන යමකින් හිරිහැරයට පත් වූයෙක් හෝ මේ වාර්තාවේ සඳහන් යම් කරුණක් සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කිරීමට කැමතිවේ නම්, මේ නිවේදනය පලවන දිනයේ සිට මාසයක් ඉකුත් වන්නට පෙර ලියවිලි මාර්ගයෙන් ඒවා කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා වෙත ලැබෙන්ට සැලැස්විය යුතුයි.

එච්. ඊ. තෙන්නකෝන්,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග සහ විදුලි බලය පිළිබඳ
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

කොළඹ, 1963 අප්‍රේල් මස 19 වැනි දින.

4-729/1

---

## 1958 අංක 1 දරණ කුඹුරු පණත

1958 අංක 1 දරණ කුඹුරු පණත යටතේ ඉදිරිපත් කෙරෙන ඇපැල් පෙත්සම් විභාග කිරීම හා තීරණය කිරීම සඳහා එම පණතේ 59 (1) වගන්තියේ හා පණත යටතේ සකස් වී ඇති රෙගුලාසිවල විධිවිධාන අනුව පිහිටුවා ඇති සමීක්ෂණ මණ්ඩලයේ 1963.5.1 වැනි දින සිට අවුරුද්දක කාලයකට සභාපති හා සාමාජිකයෙකු වශයෙන් සේවය කිරීම පිණිස පහත නම් සඳහන් අය ගරු කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ඇමති තුමා විසින් පත් කර ඇති බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

වී. ඇස්. ගුණවර්ධන මහතා

ඇම්. ශ්‍රී කාන්තා,
ස්ථිර ලේකම් වෙනුවට.

1963 අප්‍රියෙල් මස 19 දින,
කොළඹ 1, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා
විදුලි බලය පිළිබඳ අමාත්‍යාංශයේදීය.

4-695

## පඩි පාලක සභා ආඥාපනත

### නිවේදනයයි

පඩි පාලක සභා ආඥාපනතේ (136 වෙනි අධිකාරය වන) 9 වන වගන්තිය යටතේ ගරු කම්කරු හා ජනසතු සේවා ඇමතිතුමන් විසින් පහත සඳහන් පත්කිරීම් කරන ලද බව වර්ෂ 1943 පඩිපාලක සභා ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ —

(1) ඉල්වා අස්වූ ආර්. ඇල්. බ්‍රෝහියර් මහතා වෙනුවට රබර් වැවීමේ සහ තැනීමේ, පොල් වැවීමේ සහ පොල් නිපදවීම යන කර්මාන්ත පිළිබඳ පඩිපාලක සභාවන්හි නාම නියම කොට පත් කෙරෙන සාමාජිකයෙකු වශයෙන් පෙනී සිටීමට ඇස්. ඒ. විජයතිලක මහතා ; සහ

(2) ඉල්වා අස්වූ ආර්. ඇල්. බ්‍රෝහියර් මහතා වෙනුවට මෝටරථ ගමනාගමන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ නාම නියම කොට පත් කෙරෙන සාමාජිකයකු වශයෙන් පෙනී සිටීමට ජී. ඩබ්ලිව්. එදිරිවීර මහතා.

වී. ඇස්. ඇම්. ද මැල්,
සහිර ලේකම්,
කම්කරු හා ජනසතුසේවා අමාත්‍යාංශය.

1963 අප්‍රේල් මස 13 වැනි දින,
කොළඹ දීය.

4-671

---

## පඩි පාලක සභා ආඥාපනත

### නිවේදනයයි

බේකරි කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයන් වශයෙන් 1963 මාර්තු 11 වැනි දින සිට අවුරුදු තුනක කාලයක් තුළ පෙනී සිටින (136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 9 වන වගන්තිය යටතේ කම්කරු හා ජනසතු සේවා ගරු ඇමතිතුමන් විසින් පහත නම් සඳහන් තැනැත්තන් පත් කරන ලද බව 1943 පඩිපාලක සභා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

වී. ඇස්. ඇම්. ද මැල්,
කම්කරු හා ජනසතු සේවා අමාත්‍යාංශයේ,
සහිර ලේකම්වරයා.

1963 අප්‍රේල් මස 13 වැනි දින,
කොළඹ දීය.

නාම නියමකොට පත්කරනු ලබන සාමාජිකයෝ—

1. ඇන්. ඇස්. සී. පෙරේරා මහත්මිය
2. ඇස්. ඒ. විජයතිලක මහතා
3. ජේ. ඇල්. සී. රුද්රිගො මහතා

සේව්‍ය නියෝජිතවරු—

1. ඩී. ඇස්. ඉලයපෙරුම මහතා
2. කේ. ජී. එන්. සෙනෙවිරත්න මහතා
3. ඩබ්ලිව්. ඇස්. එච්. සොයිසා මහතා
4. එම්. ඒ. පියතිස්ස මහතා
5. එන්. ඩබ්ලිව්. ජේ. මුදලිගේ මහතා
6. එන්. මහාදේව මහතා
7. රිචර්ඩ් පෙරේරා මහතා
8. ජේ. ඊ. ටී. ක්‍රිස්ටෝපර් මහතා

සේවක නියෝජිතවරු—

1. තිලක කුලසේකර මහතා
2. ඇස්. ඇස්. දිසානායක මහතා
3. කේ. කුලවීරසිංහම් මහතා
4. ආර්. ජී. නාදන් මහතා
5. ජී. පී. පෙරේරා මහතා
6. ආර්. එල්. තිලකරත්න මහතා
7. එම්. කේ. පී. රාජපක්ෂ මහතා
8. එම්. ඒ. එස්. ගුණරත්න මහතා

4-670

---

## පඩි පාලක සභා ආඥාපනත

### නිවේදනයයි

පොල් වැවීමේ කර්මාන්තය පිළිබඳ පඩි පාලක සභාවේ සාමාජිකයකුව සිට මියගිය කේ. රාජලිංගම් මහතා වෙනුවට එම පඩි පාලක සභාවේ සේවක නියෝජිත සාමාජිකයෙකු ලෙස පෙනී සිටීමට පඩි පාලක සභා ආඥාපනතේ (136 වැනි අධිකාරය) 9 වන වගන්තිය යටතේ ගරු කම්කරු හා ජනසතුසේවා ඇමති තුමන් විසින් වී. කේ. වෙල්ලායන් මහතා පත් කරන ලද බව වර්ෂ 1943 පඩි පාලක සභා ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

වී. ඇස්. ඇම්. ද මැල්,
කම්කරු හා ජනසතු සේවා අමාත්‍යාංශයේ
සහිර ලේකම්වරයා.

1963 අප්‍රේල් මස 13 වැනි දින,
කොළඹ දීය.

4-669

---

## (219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනත

### රත්නපුර ආරෝග්‍යශාලා මණ්ඩලය

(219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනතෙහි 11 වෙනි වගන්තිය යටතේ 1963 අප්‍රේල් මස 5 වෙනි දින පටන් 1963 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා පී. ඩබ්ලිව්. සුමිත්‍රාරච්චි මහතා රත්නපුර ආරෝග්‍යශාලා මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් ගරු සෞඛ්‍ය ඇමතිතුමා විසින් පත් කරනු ලැබූහ.

එල්. එස්. බී. පෙරේරා,
සහිර ලේකම්.

1963 අප්‍රේල් මස 5 වෙනි දින,
කොළඹ සෞඛ්‍ය අමාත්‍යාංශයේ දීය.

4-658

---

**සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.**

**ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එව්ය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).**

**ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායකමුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායකමුදල් භාරගනු නොලැබේ.**

ලංකාවේ වැලව්වේනයෙහි පිහිටි " ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන් " හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි